# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1952/20 - 2016 පෙබරවාරි මස 02 වැනි අඟහරුවාදා - 2016.02.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**නිවැරදි කිරීම**

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

2014 අගෝස්තු මස 28 වන බ්‍රහස්පතින්දා දින අංක 1877/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* රජයේ නිවේදන යටතේ ඉහත මාතෘකාවෙන් පළ වූ නිවේදනයට පහත සඳහන් සංශෝධනයන් එක් කරනු ලබන අතර, එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

01. පිටු අංක 2A හි, 5.3 වගුවට පහතින් සඳහන් කර ඇති සටහනෙහි සඳහන් වැටුප් පියවර 6 ලෙස සංශෝධනය විය යුතුය. ඒ අනුව එම සටහන පහත පරිදි විය යුතු ය.

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලබන අවස්ථාවේ දී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) හෝ බඳවා ගැනීමෙන් පසු එම තත්ත්වය ලබාගත් විට එම නිලධාරියා සේවයේ එම ශ්‍රේණියේ 6 වන වැටුප් පියවරේ පිහිටවනු ලැබේ. එවැනි නිලධාරියකු වුවද සේවයට බැඳී වසර 3 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

02. පිටු අංක 3A හි, 7.2.2.1 යටතේ අධ්‍යාපන සුදුසුකම් ලෙස සඳහන් වගන්තිය ඉවත් කර පහත වගන්ති ආදේශ කළ යුතු ය.

(I) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පස් අවුරුදු වාස්තු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.

හෝ

(II) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(III) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබීම.

03. පිටු අංක 5A හි, 7.3.2.3 හි III කරුණ ඉවත් කළ යුතු ය.

04. පිටු අංක 7A හි, 10.2.1 හි V කරුණ ඉවත් කළ යුතු ය.

05. පිටු අංක 10A හි 18 වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

මෙම ව්‍යවස්ථාවෙහි විධිවිධාන වලට පරිබාහිර වූ කරුණු පිළිබඳ තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබනු ඇත.

1A - G 22970 — 56 (2016/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. පිටු අංක 10A හි අංක 19 යටතේ විශ්‍රාම ගැන්වීමේ විකල්පය ලෙස පහත වගන්තිය ඇතුළත් කළ යුතු ය.

නියමිත දිනය වනවිට සේවයේ නියුතුව සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධාරියෙකු හට ඔහු විසින් කරනු ලබන ඉල්ලීමක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය. එවන් සහනයක් පිරිනැමිය යුතු තරමට මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන වලින් අහිතකර බලපෑමක් එම නිලධාරියාට ඇති වී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම්, නියමිත දිනයේ සිට අවුරුදු 05 ක් තුළ ඔහුට/ඇයට එම මනාපය ප්‍රකාශ කළ හැකිය.

07. පිටු අංක 10A හි අංක 19 යටතේ පැවති ''වෙනත්'' යන්න අංක 20 ලෙස සංශෝධනය විය යුතු ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2016 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ 07, නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ දී ය.

**ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සේවා ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතු සංශෝධනයන්**

| *සංශෝධන ඇතුළත් විය යුතු වගන්තිය/පිටුව* | *ගැසට් පත්‍රයේ සඳහන් සංශෝධනය විය යුතු වාක්‍ය/වචනය* | *සංශෝධනය විය යුතු ආකාරය* |
|---|---|---|
| 5.3 (සටහන) | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලබන අවස්ථාවේ දී පූර්ණ වෘත්තීය **සුදුකම්** (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) හෝ බඳවා ගැනීමෙන් පසු එම තත්ත්වය ලබාගත් විට එම නිලධාරියා සේවයේ එම ශ්‍රේණියේ 5 වන වැටුප් පියවරේ පිහිටවනු ලැබේ. එවැනි නිලධාරියකු වුවද සේවයට බැඳී වසර 3 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා ඉඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය. | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලබන අවස්ථාවේ දී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් වාස්තු විද්‍යාඥ තත්ත්වය) හෝ බඳවා ගැනීමෙන් පසු එම තත්ත්වය ලබාගත් විට එම නිලධාරියා සේවයේ එම ශ්‍රේණියේ 5 වන වැටුප් පියවරේ පිහිටවනු ලැබේ. එවැනි නිලධාරියකු වුවද සේවයට බැඳී වසර 3 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය. |
| 09 (වගුව) | සේවය ස්ථිර කිරීමට පෙර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් සමත් වී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුයි. (වෛකල්පිත **විෂයයන්** වශයෙන් නොවේ.) | සේවය ස්ථිර කිරීමට පෙර අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයක් වශයෙන් සමත් වී සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයක් වශයෙන් නොවේ.) |
| 11.2 (ඇ) | සේවයේ විශේෂ ශ්‍රේණියේ **නිලධාරීන්න** අතුරින් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලබන නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ) | සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් අතුරින් ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලබන නිලධාරීන් විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ) |
| 16 | මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ **නිපුණතාවයක්ද** සියළු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබාගත යුතු ය. | මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අමතරව රජය විසින් කලින් කළ තීරණය කරනු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා සහ නිපුණතාවයන්ද සියළු නිලධාරීන් විසින් නියමිත පරිදි ලබාගත යුතු ය. |
| 03 වන පරිශිෂ්ඨය. 03 - විෂය අංක 02 II කොටස | ආර්ථික දේශපාලනික සංස්කෘතික සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් **සම්බන්ධනේ** වූ ප්‍රශ්න වලින් සමන්විත වේ. | ආර්ථික දේශපාලනික සංස්කෘතික සහ කලාව වැනි අනෙකුත් සාමාන්‍ය විෂයයන් සම්බන්ධයෙන් වූ ප්‍රශ්න වලින් සමන්විත වේ. |
| 04 වන පරිශිෂ්ඨය. 4 - I - (ආ) | **අනිවිශ්චිත** අවස්ථා අරමුදල | අවිනිශ්චිත අවස්ථා අරමුදල |
| 04 වන පරිශිෂ්ඨය. 4 - I - (ඌ) | (මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම) | මූල්‍ය කළමනාකරණය සඳහා කාර්යයන් පැවරීම |

02 - 499

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.